# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1533/15 - 2008 ජනවාරි මස 25 වැනි සිකුරාදා - 2008.01.25

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

විධාන අංක 19.

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1) (ආ) (ii) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1) (ආ) (ii) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් දේශීයව නිපදවන මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු තත්ත්වයේ පවතින සහල් හෝ වී සත්ත්ව ආහාර වශයෙන් කෙළින්ම භාවිතා කිරීම හෝ අන්‍යාකාරයකින් සත්ත්ව ආහාර නිපදවීම සඳහා යෙදවුමක් ලෙස භාවිතා කිරීම සඳහා විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, තොග රැස්කර තැබීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, බෙදා හැරීම, මිලදී ගැනීම නොකළ යුතු බවට සියළුම නිෂ්පාදකයින්, වෙළෙඳුන් හා බෙදාහරින්නන් වෙත මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2008 ජනවාරි මස 25 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්ෂුක්,
සභාපති.

2008 ජනවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

02 - 284/1